මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ 51 2023.06.09

**2023.06.09 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

01. 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව 2022 ඔක්තෝම්බර් මස පළමුවන දිනෙන් ආරම්භ වී 2023 වර්ෂයේ ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වැනි ව්‍යවස්ථාවේ (8) වන අනු ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම නියමය මගින්, 97 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රකාර සහ 98 වන ව්‍යවස්ථාව ප්‍රකාර, මතු දක්වා ඇති එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව පහත සඳහන් කර ඇත.

| මැතිවරණ කොට්ඨාසයේ නම | එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව |
|---|---|
| 01 - කොළඹ | 19 |
| 02 - ගම්පහ | 18 |
| 03 - කළුතර | 10 |
| 04 - මහනුවර | 12 |
| 05 - මාතලේ | 5 |
| 06 - නුවරඑළිය | 8 |
| 07 - ගාල්ල | 9 |
| 08 - මාතර | 7 |
| 09 - හම්බන්තොට | 7 |
| 10 - යාපනය | 7 |
| 11 - වන්නි | 6 |
| 12 - මඩකලපුව | 5 |
| 13 - දිගාමඩුල්ල | 7 |
| 14 - ත්‍රිකුණාමලය | 4 |
| 15 - කුරුණෑගල | 15 |
| 16 - පුත්තලම | 8 |
| 17 - අනුරාධපුරය | 9 |
| 18 - පොළොන්නරුව | 5 |
| 19 - බදුල්ල | 9 |
| 20 - මොණරාගල | 6 |
| 21 - රත්නපුර | 11 |
| 22 - කෑගල්ල | 9 |
| **එකතුව** | **196** |

02. 2023 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කොට ඇත. දිවයින පුරා එක් එක් ග්‍රාම නිලධාරී වසම්වල රාජකාරී කටයුතු කරන ග්‍රාම නිලධාරීන් විසින් ගෙන් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කාර්යයන්හි නියැලිය යුතු වන අතර, එම නිලධාරීන්ට සහාය දෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව මහජනතාවගෙන් ද ඉල්ලා සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**එච්.එම්.ටී.ඩී.හේරත්**
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව